**ගම්පහ ප්‍රාදේශීය සභාවේ - 2021**

**-------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

ගම්පහ ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගම්පහ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2.** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3.** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 3.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත තොරතුරු සන්සන්දනය කිරීමට පහසුවන ආකාරයට සත්‍ය, අයවැයගත සහ පෙර වූ තුලනාත්මක කාල පරිච්ඡේදයේ සත්‍ය වශයෙන් ඉදිරිපත් කළයුතු වටිනාකම් අතර යම් ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් ඒවාට හේතු හෙළිදරව් කළයුතු වුවත්, එසේ කටයුතුකර නොතිබුණි. | | |
| (ආ) | ප්‍රමිති අංක 10.22(ඊ) ප්‍රකාරව ගිණුම් කාල පරිච්ඡේදය තුලදී අයකරගත නොහැකි ලෙස, හුවමාරු ගණුදෙනුවලින් ලැබියයුතු දෑ ලියාහැරීම, අනුමත කළ අධිකාරිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළයුතු වුවත් ජ'නල් සටහන් අංක 26 මගින් එකතුව රු.1,045,124 ක් වූ කඩ කුලී කපාහැරීම පිළිබඳව එසේ කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමේ දී එම තොරතුරු සමඟ ඉදිරිපත් කරමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය 2017 අනුව මූල්‍ය ප්‍රකාශනවල කරුණු හෙළිදරව් කළ යුතුය. |

## 1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආදායමට ගතයුතු අයිතම 06 ක එකතු වටිනාකම රු.605,892 ක් තැන්පතු ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2021 ට අදාළ ව තැන්පත් ලෙස ලේඛණගතව ඇති පරිපාලන වියදම් 2022 දෙසැම්බර් 31 දින වන විට අදායමට ගැනීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල තැන්පතු ලෙස ගිණුම්ගත කර ඇති ආදායම්, අදායම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | පෙර වර්ෂයේ පාරවල්, පාලම්,බෝක්කු, කෙරීගෙන යන වැඩ ශේෂය වූ රු.319,231,822 ට අතිරේකව එම කාර්යයට අදාළව සමලෝචිත වර්ෂයේ ඉටුකළ ලෙස රු.8,498,839 ක් එම ගිණුමට බැර කිරිම හේතුවෙන්, රු.8,498,839 කින් ජංගම බැරකම් ශේෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඇ) | ගබඩා ණයහිමියන් සඳහා රු.20,592,348 ක් ගෙවීමේදී, ගබඩා ණයහිමි ගිණුම වෙනුවට සාවද්‍ය ලෙස වියදම් ගිණුම හර කිරිම නිවැරදි කිරීමේදී අදාල වියදම් ගිණුම් බැර කරනු වෙනුවට සමුච්චිත අරමුදල බැර කර තිබුණි. එම හේතුවෙන් රු.20,592,348 කින් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඈ) | 2020 වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන වෙනුවෙන් 2021 වර්ෂයේදී ක්‍රමක්ෂය කළ යුතු වටිනාකම රු. 13,031,174 ක් වූයෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අයභාරය යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් ලෙස එම වටිනාකම දැක්විය යුතු වුවත් රු.11,726,122 ක් දක්වා තිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,305,052 ක් අඩුවෙන් ද, ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද, ගිණුම්ගත කර තිබුණි. තවද රු.13,031,174 ක් 2020 වර්ෂයේ ක්‍රමක්ෂය ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් එම වටිනාකමින් සමුච්චිත අරමුදල ශේෂය වැඩියෙන්ද ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ක්ෂය වටිනාකම රු.193,284,969 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඊ) | 2021 ජනවාරි 01 දිනට පාරවල්, පාලම්, බෝක්කු ශේෂය රු.1,997,297,192 ක් සඳහා සියයට 10 ප්‍රතිශතය යටතේ ක්ෂය වටිනාකම රු.199,729,719 ක් විය යුතු වුවත්, ජර්නල් අංක 56 මගින් රු.171,631,349 ක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන්, සමුච්චිත අරමුදල හා දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.28,098,370 ක් බැගින් මූල්‍ය ප්‍රකාශනයේ වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී එම තොරතුරු නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 90 ප්‍රකාරව ආදායම් වියදම් හා වත්කම් බැරකම් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු බව දක්වා ඇතත් මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම් මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | මුද්දර ගාස්තු ආදායම හා උසාවි දඩ ආදායම වාර්ෂික බිල් කිරීම නිශ්චය කරගෙන ඉදිරිපත් කර නොමැති බැවින් මෙම ආදායම මුදල් පදනම මත ගිණුම් තබා ඇත. ඇස්තමේන්තු ගත ආදායම මත පදනම්ව උපචිත පදනම මත ගිණුම් තැබුවහොත් සාවද්‍ය හිඟයක් පෙන්වන බැවින් මුදල් පදනම මත ගිණුම් තබා ඇත. | උසාවි දඩ හා මුද්දර ගාස්තු උපලේඛනය ගෙන්වාගෙන ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති ප්‍රකාරව ආදායම් උපචිත පදනම මත ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

## 1.6.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

### (අ) ලැබිය යුතු ශේෂ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට විමධ්‍යගත හා පළාත් සභා ව්‍යාපෘති 540 ක් වෙනුවෙන් ලැබිය යුතු ශේෂය රු.181,167,226 ක් වී තිබුණි. කාලවිශ්ලේෂණය අනුව හිඟව පැවති කාලය ශේෂ 11 කට අදාලව රු.1,438,098 ක් වසර 5 ත් 10 ත් අතරද, ශේෂ 83 කට අදාලව රු.5,464,170 ක් වසර 3 ත් 5 ත් අතරද, ශේෂ 231 කට අදාලව රු.16,808,254 ක් වසර 1 ත් 3 අතරද, ශේෂ 215 කට අදාලව රු.157,456,704 ක් වසර 1 ට අඩුද ලෙස පැවතුණු අතර හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණයගැති ශේෂය විමධ්‍යගත හා පළාත් සභා ව්‍යාපෘති වෙනුවෙන් ලැබිය යුතු මුදල්ය. වෙනත් ආයතන වලින් ලැබිය යුතු මුදල් කපාහැරීම කළ නොහැක. මුදල් ලැබිය යුතු ආයතන වෙත දැනුම් දී තිබුණ ද, මුදල් එවීමේ ප්‍රමාදය සහ ලිඛිත ප්‍රතිචාර නොදැක්වීම මත ණයගැති ශේෂ පවතී . | ප්‍රාග්ධන ආධාර ණයගැති උපලේඛන විශ්ලේෂණය කර සුදුසු ක්‍රමවේදයක් යොදා ගනිමින්, හිඟ ශේෂය අයකර ගැනීම, සහ අදාල ලිපිගොනු නැවත පරීක්ෂා කර, ණයගැතිභාවය තහවුරු කරගැනීම කළ යුතුය. |

### (ආ) ගෙවියයුතු ශේෂ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ණය හිමි උපලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට විවිධ රාජ්‍ය ආයතන 25 කට අදාලව 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයක සිට පැවත එන ශේෂ 39 කට අදාලව ගෙවියයුතු වටිනාකම රු.4,262,322 ක් පැවති අතර, එම ශේෂ පිළිබඳව සොයා බලා නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | තවදුරටත් නිරවුල් කරමින් පවතින බව දන්වා සිටිමි. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7.** **අනුකූල නොවීම්**

**-------------------**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**------------------------------------------------------------------------**

| | **නීති රීති, රෙගුලාසි ආදියට යොමුව**<br>**------------------** | **අනුකූල නොවීම**<br>**-----------------** | **සභාවේ අදහස් දැක්වීම**<br>**--------------------** | **නිර්දේශය**<br>**------------** |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (2) | 2021 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.40,807,119 ක කල් ඉකුත් වූ තැන්පතු 64 ක් වෙනුවෙන් අදාල රෙගුලාසිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. | 2022 වර්ෂය ඇතුළත ආදායමට ගෙන නිරවුල් කිරීම සිදුවෙමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට හෝ ආපසු ගෙවා දැමීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1940 අංක 30 දරන තක්සේරු පනත | වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා වරිපනම් බදු අයකිරීම සඳහා තක්සේරුවක් කරගතයුතු වුවද, 2002 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන බදු අයකරමින් පැවතුණි. | 2018 වර්ෂයේ නව තක්සේරු කටයුතු ආරම්භ කර, හෙනරත්ගොඩ උප කාර්යාල බල ප්‍රදේශයේ තක්සේරු කටයුතු අවසන්ව ඇත. ගලහිටියාව උප කාර්යාල බලප්‍රදේශයේ තක්සේරු කටයුතු අවසන් කළ පසුව නව තක්සේරුව මත වරිපනම් බදු අයකිරීම සිදුකරනු ඇත. | පනත ප්‍රකාරව නව තක්සේරු වේටයන් ලබාගෙන අදායම් අයකර ගැනීමට කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංක 2155/8 හා 2019 දෙසැම්බර් 24 දින අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ නියෝග අංක 83(ii) | ප්‍රාදේශීය සභා නිලධාරීන් හා සේවකයන්ගේ රු.24,045,436 ක් වූ සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2023 වර්ෂයේ සිට සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. | ගැසට් පත්‍රයේ නියෝග ප්‍රකාරව සේවක ණය සඳහා වෙනම අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යායුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,806,233 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 52,803,165 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

---------------------

**ආදායම් රැස්කිරීම් කාර්යසාධනය**

---------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හෙනරත්ගොඩ උපකාර්යාලයේ ලැබියයුතු වරිපනම් ශේෂය රු.26,537,646 ක් සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත්කර නොතිබුණ අතර, ගලහිටියාව උප කාර්යාලයේ කාල විශ්ලේෂණ වාර්තාව අනුව අයවීම් හිඟහිටි කාලය වසර 10 ට වැඩි ශේෂය රු.5,904,379 ක් ද , වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.3,257,257 ක් ද, වසර 3 ත් 5 ත් අතර ශේෂය රු.1,785,800 ක් ද වසර 1 ත් 3 ත් අතර ශේෂය රු.1,140,000 ක් ද වසර 1 ට අඩු ශේෂය රු.313,255 ක් ද ලෙස එකතු ශේෂය රු.12,400,692 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | කාල විශ්ලේෂණය නිවැරදි දත්තයන්ට අනුව ලබාගැනීමට සකස් කළ වහාම විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කඩ කුලී | | |
| | ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ කඩ කාමර 4 කට අදාලව රු.264,544 ක් සහ වැලිවේරිය පොදු වෙළදපොළ එක් කඩ කාමරයකට අදාලව රු.70,400 ක් අයවීම් හිඟව පැවති කාලය වසර 5 ට වඩා වැඩිද, වැලිවේරිය පොදු වෙළදපොළ කඩ කාමර 5 කට අදාලව රු.452,420 ක් | අයකරගත නොහැකි කඩ කුලී සම්බන්ධව ගම්පහ සහකාර පළාත් පාලන කොමසාරිස් ලබාදුන් උපදෙස් මත විමර්ෂණය කිරීම සඳහා පත්කර ඇති කමිටුවෙහි වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. | හිඟ කඩකුලී කඩ හිමියන්ගෙන් හෝ අයකිරීම් පැහැර හරින ලද පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

සහ ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ කඩ කාමර 2 කට අදාලව රු.30,450 ක් අයවීම් හිඟව පැවති කාලය වසර 3 ත් 5 ත් අතරද වී තිබුණි.

## 3. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

සේවක ණය

--------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවක ණය උපලේඛන අනුව විශ්‍රාම ගිය, මියගිය හා සේවය හැරගිය සේවකයින් 12 දෙනෙකුගෙන් වසරකට වඩා වැඩි කාලයක සිට අයවීම් හිඟහිටි ශේෂය රු.492,602 ක් 2022 අගෝස්තු 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ව්‍යාපෘති සේවකයන්ගේ ණය ශේෂ ඇපකරුවන් වෙතින් අයකර ගනිමින් පවතී. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

තිරසාර සංවර්ධන අරමුණු

---------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ තිරසර සංවර්ධන ඉලක්ක ලෙස හඳුනාගෙන තිබුණ ක්‍රියාකාරකම් 70 න් ඇස්තමේන්තු වටිනාකම රු.5,542,000 ක් වූ ක්‍රියාකාරකම් 22 ක් ප්‍රවර්තන වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | රට තුල පැවති Covid වසංගත තත්වය හේතු කොට ගෙන එම වර්ෂය තුල ඉටුකර ගැනීමට නොහැකි වූ වැඩසටහන් 2022 වර්ෂයේ ඉටු කිරීමට සැලසුම් සකස් කර තිබුණද, රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා 2022 අප්‍රේල් 26 දින නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 ට අවධානය යොමු කරමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. | නිවැරදි අවශ්‍යතාවය හඳුනාගනිමින් ප්‍රතිපාදන සලසා ගැනීම සහ අවශ්‍යතාවය අනුව සංශෝධිත ඇස්තමේන්තු අනුමත කර ගෙන වියදම් දැරීම සිදු කළ යුතුය. |